# දැක්ම

දෘශ්‍ය හා ප්‍රාසංගික කලා තුළින් මානව වර්ගයාගේ සම්ප්‍රසාදය උදෙසා විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය වීම.

# මෙහෙවර

විශ්වවිද්‍යාලයේ සියලු විද්‍යාර්ථීන් සහ සාමාජිකයින් උදෙසා සංස්කෘතිකමය වශයෙන් පරිපූර්ණ අවස්ථා ලබාදීම. නිර්මාණශීලීභාවය උත්තේජනය කරන පරිසරයක් තුළ තාක්ෂණික දියුණුවට අනුකූලවන කලා සහ නිර්මාණ මගින් ආසියානු කලාපයෙහි ප්‍රමුඛතාව ලබා ගැනීම.

# පටුන


1. උපකුලපතිවරයාගේ පණිවුඩය 01-09

1.1 ආයතනික සංවිධාන සැලැස්ම 10

1.2 පාලක සභාව 11

2. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තරය 12-15

3. පශ්චාද් උපාධි පිළිබඳ විස්තර 15

4. බාහිර උපාධි පාඨමාලා පිළිබඳ විස්තර 16

5. පර්යේෂණ දීමනා ගෙවීම් පිළිබඳ විස්තර 16

5.1 2017.11.15 දින සිට 2017.11.17 දින දක්වා පවත්වන ලද පර්යේෂණ පරිසංවාදයට ඉදිරිපත් කරන ලද පත්‍රිකා පිළිබඳ විස්තර 17-21

6. කාර්ය මණ්ඩල විස්තරය 22

6.1 අනුමත කාර්ය මණ්ඩලය 22

6.2 අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 22

6.3 පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 23

6.4 සමස්ත කාර්ය මණ්ඩල වෙනස්වීම් 24

7. කාර්ය මණ්ඩල සංවර්ධනය 25

7.1 පරිපාලන කාර්යය මණ්ඩලය සහභාගි වූ සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර 25-26

7.2 අනධ්‍යයන කාර්යය මණ්ඩලය සහභාගී වූ සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර 26

8. යටිතල පහසුකම් පිළිබඳ විස්තර 27

9. පුස්තකාලය පිළිබඳ තොරතුරු 27

10. මහපොළ හා ශිෂ්‍යාධාර ලබන්නන්ගේ විස්තරය 27

11. විගණන කමිටු වාර්තාව 28

12. 2017.12.31 දිනෙන අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන වාර්තාව 29-52

13. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව 53-60

14. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාවේ පිළිතුරු ලිපිය 61-67

1. <u>උපකුලපතිවරයාගේ පණිවුඩය 2017</u>

කැලණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය, 2005 ජූලි මස 01 වෙනි දින සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තියේ (2) ඡේදය සමඟ කියවිය යුතු 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව අංක 1400/24 දරණ රජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් **සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය** ස්ථාපනය කරන ලදී. විශ්වවිද්‍යාලය සඳහා පහත දැක්වෙන මහාචාර්යවරුන් උපකුලපති තනතුරට පත් වී ඇත.

මහාචාර්ය සරත් අමුණුගම - 2005 වසරේ සිට 2008 වසර දක්වා

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ - 2008 වසරේ සිට 2014 වසර දක්වා

මහාචාර්ය ආරියරත්න කලුආරච්චි - 2014 වසරේ සිට 2017 වසරේ ඔක්තෝබර් මස දක්වා

මහාචාර්ය සරත් චන්ද්‍රජීව - 2017 ඔක්තෝබර් මස 20 වෙනි දින සිට

මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි පීඨ 03 කි. එනම් දෘශ්‍ය කලා, සංගීත සහ නර්තන හා නාට්‍ය කලා වශයෙනි. පශ්චාද් උපාධි සඳහා වන පීඨය ස්ථාපිත කරන ලද්දේ 2015 වසරේදීය. ප්‍රථම උපාධි පීඨ අධ්‍යයනාංශ 22කින් සමන්විතය. අංක 21, ඇල්බට් චන්ද්‍රවංක පරිශ්‍රය, කොළඹ 07, අංක 46, හෝර්ටන් පෙදෙස, කොළඹ 07 සහ අංක 116, එස්. ද එස්. ජයසිංහ මාවත, කොහුවල පරිශ්‍රයෙහි මෙම විශ්වවිද්‍යාලය අධ්‍යයන සහ පරිපාලන කටයුතු ස්ථානගතව තිබේ. සංගීත පීඨය, නර්තන හා නාට්‍ය කලා පීඨය, පරිපාලන ඒකක සහ වෛද්‍ය මධ්‍යස්ථානය ඇල්බට් චන්ද්‍රවංක පරිශ්‍රයෙහි ස්ථාපිත කොට ඇති අතර, දෘශ්‍ය කලා පීඨය, ශාරීරික අධ්‍යාපන ඒකකය, ප්‍රධාන පුස්තකාලය, හොර්ටන් පෙදෙස පරිශ්‍රයෙහි ස්ථාපිත කොට ඇත. කොහුවල පරිශ්‍රයෙහි නර්තන හා නාට්‍ය කලා පීඨයේ ප්‍රථම වසර අධ්‍යයන කටයුතු පවත්වාගෙන යන අතර විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයෙහි කටයුතු ද එහි සිදුකරගෙන යනු ලබයි.

අංක 146., ඇලන් ඇවනිව්, දෙහිවල පිහිටි කාන්තා නේවාසිකාගාරයේ සහ අංක 137, වලව්වත්ත, රාජගිරිය පිහිටි කාන්තා නේවාසිකාගාරයේ ශිෂ්‍යාවන් 969 ක් සඳහා නේවාසික පහසුකම් සපයා ඇති අතර සිසුන් 323 ක් සඳහා දෙහිවල පිහිටි පිරිමි නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් සපයා ඇත. අනෙකුත් විශ්වවිද්‍යාල අතරින් මෙම විශ්වවිද්‍යාලය වෙනස් වන්නේ මෙම විශ්වවිද්‍යාලයේ විෂය පථය දෘශ්‍ය සහ ප්‍රාසංගික කලා ධාරාවන්ට පමණක් සීමාවන නිසාය. මේ නිසා ලංකාවේ තිබෙන අනෙකුත් විශ්වවිද්‍යාල සමග සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සැසඳීම අපහසුය.

මෙම විශ්වවිද්‍යාලයේ 2017 වසර සඳහා ප්‍රථම වසරට බඳවා ගැනීමේ දී දෘශ්‍ය කලා පීඨයට සිසුන් 97ක් ද, නර්තන හා නාට්‍ය කලා පීඨයට සිසුන් 248 ක් ද, සංගීත පීඨයට සිසුන් 234ක් ද වශයෙන් බඳවා ගැනීම් සිදු කෙරේ. මෙම නව විද්‍යාර්ථීන් හැරුණු කොට මේ වනවිට පීඨත්‍රයෙහි වසර හතරෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව, දෘශ්‍ය කලා පීඨයේ සිසුන් 388ක් ද, නර්තන හා නාට්‍ය කලා පීඨයේ 979ක් සහ සංගීත පීඨයේ සිසුන් 850කි. ඒ අනුව සම්පූර්ණ විද්‍යාර්ථීන් එකතුව 2217කි.

**<u>ප්‍රගති සමාලෝචනය</u>**

2017 වර්ෂය තුළ දී පීඨත්‍රයට අයත් විද්‍යාර්ථීන් උදෙසා අර්ධ සහ පූර්ණ ශිෂ්‍යාධාර වශයෙන් 313 දෙනෙකුට ශිෂ්‍යාධාර පිරිනමා ඇති අතර මහපොළ ශිෂ්‍යාධාර ද සිසුන් 1095 දෙනෙකුට පිරිනමා ඇත. ඒ අනුව ශිෂ්‍යාධාර හා මහපොළ සිසුන් 1408 දෙනෙකුට ලබා දී ඇති අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 63.5% ක් වෙයි.


වෙබෝ මෙට්රික්ස් දර්ශකය අනුව දේශීය විශ්වවිද්‍යාල අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 19 වන ස්ථානයේ පසුවන අතර ජාත්‍යන්තර වශයෙන් 13086 වන ස්ථානයේ සිටී.

**<u>WEBOMETRICS RANKING WEB OF SRI LANKAN UNIVERSITIES</u>**

| Ranked Month | Ranking Position |
|---|---|
| Jan/2016 | 16 |
| Jul/2016 | 08 |
| Jan/2017 | 16 |
| Jul/2017 | 19 |

Ranking

position




| වර්ෂය | ප්‍රතිපාදන මුදල රු.මි. | | උපයෝජනය රු.මි. | |
|---|---|---|---|---|
| 2017.01.01 - 2017.10.31 | 400 | 755.24 | 301.75 | 588.61 |

**ප්‍රතිපාදන උපයෝජනය**

**ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රගතිය**

| Premises | Project | Progress |
|---|---|---|
| Increase the physical space availability of Horton Place | Design and Build contract is in progress | Excavation works are progressing. Application has submitted for UDA approval |
| Increase the physical space availability of Albert Crescent | Albert Crescent Development Project (870MN)<br><br>Building for the Music Faculty and common facilities is in progress. | Completed<br><br>Foundation stone was laid on 3rd July 2017. |
| Increase the physical space availability of Hostel – Dehiwala | Hostel building for 400 students<br><br>Hostel building constructed by the MOHE was handed over to the university. (400)<br><br>Dehiwala Hostel – Stage II | declared open for the students as a boy's hostel<br><br>declared open on 4th October 2017 as a girl's hostel<br><br>Construction work is in progress. Identified additional works are completing. |
| Increase the physical space availability of Hostel - Rajagiriya | Hostel building for 400 students<br><br>Hostel building constructed by the MOHE was handed over to the university.<br><br>Rajagiriya Hostel – Stage II | Hostel was declared open for the students.<br><br>Hostel was declared open for students<br><br>Preparation of Bidding document is progressing |

**පර්යේෂණ දිරිගැන්වීම**

විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ දිරිගැන්වීම සඳහා ප්‍රතිපත්ති මාලාවක් සහ ක්‍රමවේද සකස් කරමින් පවතී. මේ යටතේ, පහත කාර්යභාරය දැනට සිදුවේ.

1. ස්ථිර කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ග්‍රන්ථ මුද්‍රණය දිරිගැන්වීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම.
2. ස්ථිර කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර ලබාදීම.
3. පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සඳහා විදේශීය/දේශීය සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම වෙනුවෙන් මූල්‍යාධාර ලබාදීම.
4. අධ්‍යයන/ විධායක ශ්‍රේණිවල සාමාජිකයින්ගේ පර්යේෂණ කටයුතු දිරිගැන්වීම සඳහා වැටුපට පර්යේෂණ දීමනා මාසිකව ලබාදීම.
5. වාර්ෂික පර්යේෂණ පරිසංවාද දේශීය/විදේශීය පර්යේෂකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.

6. 7 වන පර්යේෂණ පරිසංවාදය 2017-11-15 සහ 16 වන දින පණීභාරත රංග ශාලාවේදී පවත්වන්නට යෙදුණි.

7. පර්යේෂණ දිරිගැන්වීමේ වැඩමුළු පැවැත්වීම.

8. විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ පරිසංවාද පත්‍රිකා ග්‍රන්ථයක් සහ පර්යේෂණ පත්‍රිකා විමර්ශන සඟරාවක් වාර්ෂිකව එළි දැක්වීම.

**<u>විවිධ වැඩසටහන් සහ වැඩමුළු පිළිබඳ විස්තර</u>**

**<u>සංගීත පීඨය</u>**

- 2017 පෙබරවාරි මාසයේ දී සංගීත පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ භරතනාට්‍යම් සහ ඔඩිස්සි නර්තන ශිල්පී සොනාල් මන්සින්ග් මහතා ය. ( Sonal Mansingh)

- භාරතයේ බෙණාරාස් විශ්වවිද්‍යාලයේ ආචර්ය ස්වර්ණ කුණ්ටියා මහත්මිය විසින් ශාස්ත්‍රීය වයලීන් වාදන වැඩමුළුව හා ශාස්ත්‍රීය ප්‍රසංගයක් පෙ.ව. 9.00 සිට පස්වරු 1.00 දක්වා ආචාර්ය ලයනල් එදිරිසිංහ ශ්‍රවණාගාරයේ දී 2017-06-23 වන දින පවත්වන ලදී.
- භාරතයේ බෙණාරාස් හින්දු විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ පීඨාධිපති මහාචාර්ය පණ්ඩිත් බිරේන්ද්‍රනාත් මිශ්‍රා සහ ප්‍රසිද්ධ තබ්ලා වාදන ශිල්පී අභිෂේක් මිශ්‍රා යන ශිල්පීන් දෙපළ විසින් ශාස්ත්‍රීය සිතාර්/තබ්ලා වාදන වැඩමුළුක් සහ ශාස්ත්‍රිය ප්‍රසංගයක් ආචාර්ය ලයනල් එදිරිසිංහ ශ්‍රවණාගාරයේ දී 2017-06-27 සහ 28 යන දෙදින පැවැත්විණි.

- උඩරට අසුර ගිරි රාක්ෂ බලි ශාන්තිකර්මය පිළිබඳ වැඩමුළුවක් 2017-07-10 වන දින සිට 2017-07-13 වන දින දක්වා මානව වංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන් විසින් සංවිධානය කරන්නට යෙදුණ අතර 2017-07-12 වන දින හිමිදිරියේ පැවති ශුභ වේලාවට අනුව බලිය ඇඹීම ආරම්භ කෙරුණ අතර 2017-07-13 වන දින පහන් වනතුරු මෙම ශාන්තිකර්මය සාර්ථකව පැවැත්විණි. එස්.වී. හේමපාල ඇලියාව මහතා ප්‍රධාන හතර දෙනෙකුගෙන් යුත් ඇඳුරු මඬුල්ලක් මේ සඳහා සහභාගී විය.

- සංගීත පීඨයේ සිසුන් විසින් 2017 නොවැම්බර් මස 14 සිට 17 වන දින දක්වා "**ආර්තී**" නමින් සංගීත වැඩසටහනක් පවත්වන්නට යෙදුණි.

- බටහිර සංගීත අධ්‍යයනාංශයේ සිසුන් විසින් "Harmonius Expression" නමින් ප්‍රසංගයක් 2017-11-29 වන දින විශ්වවිද්‍යාලයේ දී පවත්වන්නට යෙදුණි.

## නර්තන හා නාට්‍ය කලා පීඨය

- නර්තන හා නාට්‍ය කලා පීඨයේ පහතරට නර්තන අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන්ගේ නිර්මාණශීලී නර්තන ප්‍රසංගයක් 2017 පෙබරවාරි මස 02 වන දින පණීභාරත රංග ශාලාවේ දී පවත්වන්නට යෙදුණි. මෙම නර්තන ප්‍රසංගය එම නර්තන අධ්‍යයනාංශයේ අවසන් වසර විභාගය සඳහා ලකුණු ලබා ගැනීමට අවස්ථාවක්ද විය.
- නර්තන හා නාට්‍ය කලා පීඨයේ ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද කථක් නර්තනය හදාරණ ප්‍රථම වසර සිසුන්ගේ ගෙජ්ජි බැඳීමේ උත්සවය එනම් ගුංගුරු උත්සවය නර්තන හා නාට්‍ය කලා පීඨයේ දී 2017 පෙබරවාරි මස 09 වන පවත්වන්නට යෙදුණි.
- නර්තන හා නාට්‍ය කලා පීඨයේ පහතරට නර්තන අධ්‍යයනාංශයේ ප්‍රථම වසර සිසුන්ගේ "කලඑළි මංගල්‍යය" සහ ශාන්ති කර්ම පෙළපාලියක් 2017 පෙබරවාරි මස 15 වන දින විශ්වවිද්‍යාල භූමියේ දී පවත්වන්නට යෙදුණි.
- නර්තන හා නාට්‍ය කලා පීඨයේ අවසන් වසර විද්‍යාර්ථීන් විසින් 2017 පෙබරවාරි මස 17 වන දින රාත්‍රියේ නාට්‍යමය සිදුවීම් ප්‍රදර්ශනය කරමින් නර්තන අංග රැසක් (එනම් පහතරට සාම්ප්‍රදායික නර්තන කලාවේ එන ශාන්තිකර්ම පෙළපාලි) විශ්වවිද්‍යාල භූමියේ දී රඟ දක්වන්නට යෙදුණි. මේ සඳහා උපකුලපති ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර පීඨත්‍රයේ පීඨාධිපතිවරුන්, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථීන් ද එක් වූහ.
- නර්තන හා නාට්‍ය කලා පීඨයේ විෂයමාලා සමාලෝචනය හා සංශෝධනය කිරීම සඳහා වන නේවාසික වැඩමුළුවක් 2017 පෙබරවාරි මස 23 වන දින සිට 25 වන දින දක්වා පානදුර නව්රෝ බීච් හෝටලයේ දී (Navro Beach Hotel) පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පවත්වන්නට යෙදුණි.
- උඩරට නර්තන අධ්‍යයනාංශයේ තෙවන වසර විද්‍යාර්ථීන් විසින් "ගෝකුළ" නම් වූ නිර්මාණාත්මක නර්තන ප්‍රසංගයක් 2017 මාර්තු මස 15 වන දින පණීභාරත රංග ශාලාවේ දී වේදිකා ගත කරන්නට විය.
- නර්තන හා නාට්‍ය කලා පීඨයේ ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යයනාංශයේ අවසන් වසර විද්‍යාර්ථීන් විසින් "ලිහිණි" නමින් ප්‍රථම චිත්‍රපටය නිෂ්පාදනය කොට එය 2017 අප්‍රේල් මස 04 වන දින පණීභාරත රංගශාලාවේදී ඉදිරිපත් කරන්නට යෙදුණ අතර මෙය ඔවුන්ගේ අවසන් වසර විභාගයේ ලකුණු ලබා ගැනීමේ එක් කොටසක් ද වේ.
- නර්තන හා නාට්‍ය කලා පීඨයේ ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද "**අරංගේත්‍රම්**" සහ **"ගුරු දක්ෂිණා**" වැඩසටහන විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී 2017 පෙබරවාරි මස 25 වන දින පවත්වන්නට යෙදුණි.

## දෘශ්‍ය කලා පීඨය

- 2017 ජනවාරි මස 14 වන දින චීන කලා ඇකඩමියෙහි මහාචාර්ය වැන්ග් ෂින්ග්ෆෙල් (Prof. Wang Xiongfel) ඇතුළු ආචාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථීන් කිහිපදෙනෙකු දෘශ්‍ය කලා පීඨයේ වැඩසටහන් කිහිපයකට සම්බන්ධ විය. ඒ අතර දෘශ්‍ය කලා පීඨයේ ආචාර්යභවතුන් සහ චීන කලා ඇකඩමියෙහි ඒකාබද්ධ බිතුසිතුවම් චිත්‍ර ප්‍රදර්ශනයක් ජේ.ඩී.ඒ. පෙරේරා කලා ගාරයේ දී පවත්වන්නට යෙදුණ අතර දෘශ්‍ය කලා පීඨ විද්‍යාර්ථීන් සඳහා බිතුසිතුම් නිර්මාණය පිළිබඳව වැඩමුළුවක් පැවැත්වීම මෙන්ම බිතුසිතුවම් කලාව පිළිබඳව සම්මන්ත්‍රණයක් පැවැත්වීම ද සිදුකරන්නට විය.

- ස්වාධීන රූපවාහිනී සේවය විසින් 2017 ජනවාරි මස 27 වන දින දෘශ්‍ය සන්නිවේදන සැලසුම් අධ්‍යයනාංශයේ අවසන් වසර විද්‍යාර්ථීන් සඳහා වැඩමුළුවක් පවත්වන්නට යෙදුණ අතර මෙහි මූලික අරමුණ වූයේ දෘශ්‍ය කලා ක්ෂේත්‍රයේ දෘශ්‍ය සන්නිවේදනයේ කාර්යභාරය, ග්‍රැෆික් නිර්මාණයන් හි වර්ධනය සහ මෙම ක්ෂේත්‍රයේ පරිගණක සහ රූපවාහිනී තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව දැනුම ලබාදීමයි.

- රෙදිපිළි හා ඇඟලුම් කලා අධ්‍යයනාංශයේ තෙවන සහ සිව්වන වසර විද්‍යාර්ථීන් විසින් "Footwear and Leather Fair - 2017" නමින් ප්‍රදර්ශනයක් 2017 පෙබරවාරි මස 02 වන දින සිට 05 වන දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන්නට යෙදුණි.

- දෘශ්‍ය කලා පීඨයේ මූර්ති කලා අධ්‍යයනාංශය විසින් IVAE- 2017 ජාත්‍යන්තර දෘශ්‍ය කලා ප්‍රදර්ශනය 2017 මැයි මස 18 වන දින සිට 21 වන දින දක්වා ජේ.ඩී.ඒ. පෙරේරා කලාගාරයේ දී පවත්වන්නට යෙදුණි. මෙහි මූලික අරමුණ වූයේ විද්වතුන්, පර්යේෂකයන්, කලාකරුවන්, කර්මාන්තකරුවන්, සහ සිසුන් අතර අන්තර් සම්බන්ධතා ශක්තිමත් කිරීමෙන් ඵලදායී සහයෝගීතාවයෙන් ඔවුනගේ දැනුම සහ අත්දැකීම් පුළුල් කිරීමට අවස්ථාවක් ලබා දීමයි.

- **'හැඳින ගනු වස් සොඳුරු හදවත්' වැඩසටහන**
  2017.07.10 වන දින සිට 2017.07.14 වන දින දක්වා කොළඹ රාජකීය විද්‍යාලයේ 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සිසුන් හට දෘශ්‍ය කලා පීඨයේ විද්‍යාර්ථීන් කණ්ඩායමක් හා ආචාර්යවරුන් සම්බන්ධ වී පැවැත්වූ මෙම වැඩසටහන සතියක කාලයක් පුරා සෑම දිනකම පෙ.ව. 7.00 සිට පෙ.ව. 9.00 දක්වා පවත්වා ඇත.

- ආචාර්ය මනෝරංජන් හේරත් මහතා විසින් 2017.07.04 සිට 2017.07.18 දක්වා 'THE WALAWWA' නැමති ස්ථානයේ දී (In) Visible dialogues - Sculpture & Drawings ඒකපුද්ගල දෘශ්‍යකලා ප්‍රදර්ශනයක් පැවැත්වීම. තත් සාමාජීය මානවයාගේ ජීවිතවල අභ්‍යන්තරික හැඟීම් ප්‍රකාශනය සහ එකී සංවාද දෘශ්‍ය රූපයට ගොනු කිරීමෙහි නිර්මාණ සංකල්පය වූ අතර මෙම ප්‍රදර්ශනය සඳහා මූර්ති 10කින් සහ රේඛා චිත්‍ර 14කින් සමන්විත විය.

- **සාර්ක් චිත්‍ර ශිල්පීන්ගේ කලා කඳවුර නේපාලය - 2017**

  මුද්‍රණ කලා අධ්‍යයනාංශයේ තාවකාලික කථිකාචාර්ය ඒ. බී. ජේ. පුෂ්පකුමාර මහතාට 2011/2012 රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙලේ මුද්‍රණ කලා අංශයේ ප්‍රථම ස්ථානය හිමිවීම නිසා සංස්කෘතික අමාත්‍යංශය සහ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය එක්ව 2017.07.26 සිට 2017.08.01 දක්වා නේපාලයේ පැවති කලාකරුවන්ගේ වැඩමුලුව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීමට අවස්ථාව ලැබුණි.

- Dream Project – චිත්‍ර කලා අධ්‍යයනාංශය

  Korea National University සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අතර හුවමාරු වැඩසටහනක් ලෙස චිත්‍ර ප්‍රදර්ශනයක් දෘශ්‍ය කලා පීඨයේ දී 2017-08-01 දින සිට 2017-08-13 වන දින දක්වා පවත්වන ලදී.

- Workshop – Department of Printmaking

  මුද්‍රණ කලා අධ්‍යයනාංශය 2017.09.20 දින චීන දෘශ්‍ය කලාවන් හා එහි පර්යේෂණ නමින් වැඩමුළුවක් පවත්වන ලදී. ඒ සඳහා චීන ජාතික පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් දෘශ්‍ය කලා පීඨයේ මුද්‍රණ කලා අධ්‍යයනාංශයේ ආරාධනාවෙන් පැමිණෙන ලදී.

  මෙම වැඩමුළුව චීන දෘශ්‍ය කලාවන් සහ එහි පර්යේෂණයන් යන පාඨය ඔස්සේ පැවැත්වුණු අතර වැඩමුළුවේ ප්‍රධාන සම්බන්ධීකාරක වශයෙන් Canon Digital Press ආයතනයේ සභාපති දිනේෂ් කුලතුංග මහතා කටයුතු කළ අතර වැඩමුළුවේ ප්‍රධාන ආරාධිතයා මෙන්ම වැඩමුළුව මෙහෙය වීමෙන් චීන ජාතික (China Artists Association member/ China Hue Art Society member) Chenxin (චෙන්ෂුයි) මහත්මිය කටයුතු කරන ලදී.

**<u>පර්යේෂණ සම්බන්ධව</u>**

දේශීය සහ විදේශීය පර්යේෂකයන් 41කුගේ සහභාගීත්වයෙන් හත්වැනි පර්යේෂණ පරිසංවාදය නොවැම්බර් මස 15 සිට 17 දින දක්වා විශ්වවිද්‍යාලයේ දී පැවැත්විණි. මෙහිදී පර්යේෂණ සැසි වාර හතක් පැවැත්විය.

- නාට්‍ය හා රංගකලාව පර්යේෂණ සැසිය
- නිර්මාණාත්මක රචනය සහ සංස්කෘතික අධ්‍යයනය සැසිය
- සන්නිවේදනය සහ මාධ්‍යය සැසිය
- නර්තනය සැසිය
- සංගීත සැසිය
- දෘශ්‍ය කලා සැසිය
- කළමණාකරණය සහ තොරතුරු තාක්‍ෂණය සැසිය

## කාර්ය මණ්ඩලසංවර්ධන මධ්‍යස්ථානය

- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් විෂය මාලා සංවර්ධනය පිළිබඳ වූ වැඩමුළුවක් 2017 පෙබරවාරි මස 23 වන දින සිට 25 දින දක්වා නර්තන හා නාට්‍ය කලා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පවත්වන්නට යෙදුණි.

- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් ගැටුම් කළමණාකරනය සහ දුක්ගැනවිලි පාලනය කිරීම පිළිබඳව වූ වැඩමුළුවක් 2017 අප්‍රේල් මස 26 වන දින පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වුණි.

- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් සාමාන්‍ය හැසිරීම, කාර්ය පටිපාටි සහ නිවාඩු පිළිබඳ වැඩමුළුවක් 2017 මැයි මස 05 වන දින කාර්යාල කාර්ය සහායක කාර්ය මණ්ඩලය සඳහා පවත්වන්නට යෙදුණි.

- 2017 මැයි මස 17 වන දින 2017 ජූනි මස 20 වන දින කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාලයේ සියලු කාර්ය මණ්ඩලය සඳහා රසවින්දන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- 2017-12-29 සහ 30 යන දෙදින විශ්වවිද්‍යාලයේ පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් නුවරඑළිය සණස ආයතනයේ දී වැඩමුලුවක් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය හරහා පවත්වන්නට යෙදුණි.

## විශේෂ වැඩසටහන්

- ආචාර්ය මහගම සේකර අනුස්මරණ ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය නර්තන හා නාට්‍ය කලා පීඨයේ පණීභාරත රංග ශාලාවේ දී 2017 ජනවාරි මස 16 වන දින ආචාර්ය මහගම සේකරයන්ගේ පවුලේ ඥාතීන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන්නට යෙදුණි. මෙම ශිෂ්‍යත්වය පීඨත්‍රයෙහි එක් එක් අධ්‍යයන වර්ෂයේදී වැඩිම GPA අගය ලබා ගන්නා විද්‍යාර්ථීන් තිදෙනෙකු සඳහා පිරිනැමීම වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේ දී සිදුකරන්නට තීරණය කොට ඇත. මෙම උත්සව අවස්ථාව සඳහා උපකුලපති, මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මහතා, පීඨාධිපතිවරුන්, අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය මෙන්ම විද්‍යාර්ථීන් ඇතුළුව ප්‍රසිද්ධ කලාකරුවන් ද සහභාගී වූහ.

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ හිටපු කුලපති, හෙළයේ මහා ගාන්ධර්ව පද්මශ්‍රී පණ්ඩිත් ආචාර්ය අමරදේවයන් දූයෙන් සමුගෙන තෙමසක් පිරීම නිමිතිකොට 2017 පෙබරවාරි මස 01 වෙනි දින මහා සංඝයා වහන්සේලා 89 නමක් විෂයෙහි සාංඝික දානමය පිංකමක් විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී, සියලු කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන් සහ කලාකරුවන්ගේ දායකත්වයෙන් සිදු කරන්නට යෙදුණි.

- 2017 පෙබරවාරි මස 04 වන දින සීෂෙල්ස් (Seychelles) රාජ්‍යයේ නිදහස් දින සැමරුම සඳහා සීෂෙල්ස් (Seychelles) රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපතිගේ ආරාධනාවකට අනුව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති ඇතුළු නර්තන කණ්ඩායමක් ඒ සඳහා සහභාගී වූහ.

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීමේ සමාරම්භක උළෙල 2017 පෙබරවාරි මස 27 වන දින විශ්වවිද්‍යාල භූමියේ දී පවත්වන්නට යෙදුණ අතර මෙහි ආරාධිත අමුත්තා වූයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප-සභාපති, මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතායි.

- ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයේ 2017 පෙබරවාරි මස 28 වන දින සිට මාර්තු මස 08 වන දින දක්වා පැවති උපායමාර්ගික කළමණාකරනය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති, මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මහතා සහභාගී විය.

- විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සංවිධානය කරන ලද පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වූ වැඩමුළුවක් 2017.06.22 දින සංගීත පීඨයේ ආචාර්ය ලයනල් එදිරිසිංහ ශාලාවේ දී පවත්වන්නට යෙදුණි. මෙම වැඩමුළුවෙහි සම්පත් දායකත්වය ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, ආචාර්ය චම්මික මල්ලවාරච්චි මහතා විසින් ලබාදෙන ලදී. මෙම විෂය සඳහා ඇල්මක් දක්වන විද්‍යාර්ථීන් මේ සඳහා සහභාගී වූහ.

- ජපන් තානාපති කාර්යාලය සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අතර පවතින සහයෝගීතාවයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝක ප්‍රසිද්ධ ජපන් කලාකාරිනියක වන Un Yamada මහත්මිය විසින් 2017 ජූලි මස 28 වන දින සංගීත පීඨයේ ආචාර්ය ලයනල් එදිරිසිංහ ශාලාවේ දී ප්‍රසංගයක් පවත්වන්නට යෙදුණි. මීට අමතරව මෙයට සමගාමීව වැඩමුළු කිහිපයක් ද සංවිධානය කළ අතර එය 2017 ජූලි මස 24 දින සිට 27 දින දක්වා පැවැත්විණි.

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ආරියරත්න කලුආරච්චියන් විසින් අධ්‍යක්ෂණය කරන ලද "තුන්බිය" මුද්‍රා නාට්‍ය සංස්කෘතික අමාත්‍යාංශව සමඟ එක්ව 2017 ජූලි මස 27 වන දින නෙළුම් පොකුණ රංග ශාලාවේ දී වේදිකාගත කරන්නට යෙදුණි. මෙහි ආරාධිත අමුත්තා වූයේ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාය.

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 12 වන සංවත්සර කලා උළෙලට සමගාමීව 2017 ජූලි මස 04 වන දින අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සීෂෙල්ස් හි කලා හා නිර්මාණ ආයතනය (the Seychelles Institute of Art and Design of the Ministry of Education and Human Resource Development) සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන්නට යෙදුණි.


- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 12 වන සංවත්සර සැමරුම නිමිත්තෙන් 2017 ජූලි මස 03 වන දින සිට 2017 ජූලි මස 09 වන දින දක්වා විවිධ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

- Seychelles Art & Design Institute සමඟ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව දෘශ්‍ය කලා පීඨයේ ඒ. එස්. පී.අරවින්ද මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) - 2017.09.11 සිට 2017.09.15 දින දක්වා සීෂෙල්ස්හි (Seychelles Art & Design Institute) පැවති ආලේඛ්‍ය චිත්‍ර වැඩමුලුවක් සඳහා සහභාගී වීම.

- විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපායික සැලැස්ම හරහා විශ්වවිද්‍යාලය ඉදිරි ගමන්මග පිළිබඳව සෞන්දර්ය විශ්වවිද්‍යාලයීය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017-11-02 වන දින නෙලුම් පොකුණ පරිශ්‍රයේ දී පවත්වන්නට යෙදුණි. එහිදී මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා එහි ප්‍රධාන දේශනය සිදුකරන ලදී.

- විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයෙහි උපාධි ප්‍රදානෝත්සවය 2017-12-10 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන්නට යෙදුණි. මෙහිදී 253 දෙනෙකු සඳහා බාහිර උපාධි පිරිනමන ලද අතර 30 දෙනෙකු සඳහා කථක්, භරත නාට්‍යම් සහ රූපවාහිනී සහ සිනමාකරණය පිළිබඳව ඩිප්ලෝමා සහතික පිරිනමන ලදී.

## 1.1 ආයතනික සංවිධාන සැලැස්ම




* කා.ම.ස.ඒ. - කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය
* වි.දු.අ.කේ. - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
* වෘ.මා.ඒ. - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
* අ.ත.ස.ඒ. - අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය
* ශා.අ.ඒ. - ශාරීරික අධ්‍යාපන ඒකකය

## 1.2 පාලක සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්ති ප්‍රකාරව සහ 1985 අංක 07 දරණ (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්ති ප්‍රකාරව 2016 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| | |
|---|---|
| උපකුලපති | මහාචාර්ය ආරියරත්න කළුආරච්චි මයා (2017.10.19 දින දක්වා) |
| | මහාචාර්ය සරත් චන්ද්‍රජීව මයා (2017.10.20 දින සිට) |

**පීඨාධිපතිවරුන්**

| | |
|---|---|
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | මහාචාර්ය සරත් චන්ද්‍රජීව මයා (2017.10.19 දින දක්වා) |
| | ආචාර්ය සෞම්‍ය ලියනගේ මයා (2017.10.20 දින සිට) |
| දෘශ්‍ය කලා පීඨය | සහාය මහාචාර්ය එම්.ආර්.පොඩිනිලමේ මයා |
| සංගීත පීඨය | මහාචාර්ය කෝලිත භානු දිසානායක මයා (2017.12.01 දින දක්වා)) |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විල්ටස් දයාවංශ මයා (2017.12.04 දින සිට) |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | ජ්‍යෙ.මහාචාර්ය මුදියන්සේ දිසානායක මයා |

**සනාතන සභා නියෝජිත**

| | |
|---|---|
| නර්තන හා නාට්‍ය කලා පීඨය | මහාචාර්ය මංගල සේනානායක මයා |
| දෘශ්‍ය කලා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජගත් රවීන්ද්‍ර මයා |

**පහත සඳහන් සාමාජිකයින් 2015 අප්‍රේල් මස සිට අවුරුදු 3 ක කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලදී.**

මහාචාර්ය කුසුමා කරුණාරත්න මිය
ආචාර්ය ධර්මසේන පතිරාජ මයා
ආචාර්ය එල්.ඒ.ඩබ්.සිරිසේන මයා
ආචාර්ය ජයලත් මනෝරත්න මයා
චිත්‍රා කරුණාරත්න මිය
සී.මාලියද්ද මයා
ගාමිණී සුමනසේකර මයා
ගුණසේන තේනබදු මයා

**කාර්යාල උපස්ථිතියෙන්**

ආර්.ටී.එම්. රණතුංග මිය - ලේඛකාධිකාරී(වැ.බ.)

සමාලෝචිත වර්ෂය තුළ පැවැති මුළු රැස්වීම් ගණන 14 කි.

02. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

(අ.) සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර 2017

| පීඨය | අධ්‍යයනාංශය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | මුළු තාවකාලික කථිකාචාර්ය | මුළු බාහිර කථිකාචාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා | 74 | | 29 | 01 | 25 | 119 | 21 |
| | මූර්ති කලා | 41 | | | | | | |
| | දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ කලා | 44 | | | | | | |
| | සෙරමික් කලා | 35 | | | | | | |
| | බහු ශික්ෂණාත්මක නිර්මාණ කලා | 41 | | | | | | |
| | රෙදිපිළි හා ඇඟළුම් කලා | 45 | | | | | | |
| | ඉතිහාසය හා කලා සිද්ධාන්ත | 35 | | | | | | |
| | බහු මාධ්‍ය කලා | 38 | | | | | | |
| | මුද්‍රණ කලා | 34 | | | | | | |
| **එකතුව** | | **387** | | **29** | **01** | **25** | **119** | **21** |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | | පළමු වසර | 2,3 සහ 4 වසර | | | | | |
| | උඩරට නර්තන | 215 | 343 | 36 | 33 | 06 | 63 | 19 |
| | පහතරට නර්තන | | 91 | | | | | |
| | සබරගමු නර්තන | | 49 | | | | | |
| | වාද්‍ය සංගීත | | 17 | | | | | |
| | ඉන්දියානු සහ ආසියානු නර්තන | | 49 | | | | | |
| | නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත | | 84 | | | | | |
| | නාට්‍ය කලා,මුද්‍රා නාට්‍ය සහ නූතන නැටුම් | 36 | 100 | | | | | |
| **එකතුව** | | **251** | **733** | **36** | **33** | **06** | **63** | **19** |
| සංගීත පීඨය | | 1 වසර | 2,3 සහ 4 වසර | | | | | |
| | උත්තර භාරතීය සංගීත | 235 | 333 | 39 | 17 | 05 | 44 | 17 |
| | දක්ෂිණ භාරතීය සංගීත | | 15 | | | | | |
| | බටහිර සංගීත | | 112 | | | | | |
| | මානවවංශ සංගීත | | 73 | | | | | |
| | ව්‍යවහාරික සංගීත සහ ජනශ්‍රැති | | 58 | | | | | |
| | සංගීත විද්‍යා | | 27 | | | | | |
| | පරිගණක | | - | | | | | |
| **එකතුව** | | **235** | **618** | **39** | **17** | **05** | **44** | **17** |

(ආ).**සම්පත් සහ සිසුන් පිළිබඳ සංසන්දනාත්මක විස්තර 2016/2017**

| පීඨය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| දෘශ්‍ය කලා පීඨය | 385 | 391 | 27 | 29 | 02 | 01 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 1003 | 980 | 38 | 36 | 34 | 33 |
| සංගීත පීඨය | 801 | 854 | 39 | 39 | 16 | 17 |
| **එකතුව** | **2189** | **2225** | **104** | **104** | **52** | **51** |

(ඇ) **දේශීය සිසුන් පිළිබඳ විස්තර – මාධ්‍ය සිංහල**

**ප්‍රථම උපාධිය 2017**

| **පීඨය** | **පාඨමාලාව** | **ඇතුලත් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව** | | | |
|---|---|---|---|---|---|
| | | පළමු වසර | දෙවන සර | තෙවන වසර | අවසාන වසර |
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා පාඨමාලාව | 23 | 14 | 18 | 19 |
| | මූර්ති කලා | 09 | 09 | 08 | 15 |
| | දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ කලා | 11 | 13 | 09 | 11 |
| | සෙරමික් කලා | 07 | 10 | 10 | 08 |
| | බහු ශික්ෂනාත්මක නිර්මාණ කලා | 09 | 13 | 09 | 10 |
| | රෙදිපිළි හා ඇඟළුම් කලා | 09 | 11 | 13 | 12 |
| | ඉතිහාසය හා කලා සිද්ධාන්ත | 09 | 08 | 10 | 08 |
| | බහු මාධ්‍ය කලා | 10 | 11 | 09 | 08 |
| | මුද්‍රණ කලා | 09 | 07 | 09 | 09 |
| **එකතුව** | | **96** | **96** | **95** | **100** |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | උඩරට නර්තන | 215 | 120 | 118 | 105 |
| | පහතරට නර්තන | | 31 | 23 | 37 |
| | සබරගමු නර්තන | | 14 | 18 | 17 |
| | වාද්‍ය සංගීත | | 03 | 06 | 08 |
| | ඉන්දියානු සහ ආසියානු නර්තන | | 20 | 13 | 16 |
| | නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත | | 20 | 38 | 26 |
| | නාට්‍ය කලා,මුද්‍රා නාට්‍ය සහ නුතන නැටුම් | 36 | 35 | 35 | 30 |
| **එකතුව** | | **251** | **243** | **251** | **239** |
| සංගීත පීඨය | උත්තර භාරතීය සංගීත | 235 | 122 | 117 | 94 |
| | දක්ෂිණ භාරතීය සංගීත | | 03 | 04 | 08 |
| | බටහිර සංගීත | | 47 | 31 | 34 |
| | මානවවංශ සංගීත | | 18 | 29 | 26 |
| | ව්‍යවහාරික සංගීත සහ ජන සන්නිවේදන | | 13 | 24 | 21 |
| | සංගීත විද්‍යා | | 13 | 07 | 07 |
| | පරිගණක ඒකකය | | - | - | - |
| **එකතුව** | | **235** | **216** | **212** | **190** |

(ඈ.) **ප්‍රථම උපාධිය පිළිබඳ සංසන්දනාත්මක විස්තර 2016/2017**

| පීඨය | ඇතුළත් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | | උපාධි ලබා පිටවූ සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 |
| දෘශ්‍ය කලා පීඨය | 150 | 94 | 136 | 83 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 272 | 259 | 255 | 247 |
| සංගීත පීඨය | 156 | 170 | 135 | 151 |
| එකතුව | 578 | 523 | 526 | 481 |

(ඉ.) **උපාධිලාභීන්ගේ විස්තර (2017)**

| **පීඨය** | විභාගය සඳහා පෙනී සිටි සංඛ්‍යාව | පළමු පෙළ | දෙවන පෙළ (ඉහළ) | දෙවන පෙළ (පහළ) | සමත් | උපාධිය සම්පූර්ණ කළ සංඛ්‍යාව | අසම්පූර්ණ |
|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 95 | 03 | 41 | 26 | 13 | 83 | 08 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 256 | 06 | 137 | 81 | 23 | 247 | 08 |
| සංගීත පීඨය | 166 | 03 | 47 | 55 | 46 | 151 | 12 |
| එකතුව | 517 | 12 | 225 | 162 | 82 | 481 | 28 |

(ඌ) **වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පිළිබඳ විස්තර : 2017**

1. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2016 වර්ෂය සඳහා සේවා නියුක්ති සංගණනය පැවැත්වීම.
2. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් පැවැත්වූ How to become an Entrepreneur වැඩසටහන 2017.06.13 දින පැවැත්විණ
3. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් සඳහා ශිෂ්‍ය උපදේශන සේවාව ලබාදීම.
4. Thesis Marking යන මාතෘකාව යටතේ 2017.06.22 යන දින වැඩමුළුවක් පැවැත්වීම.
5. CEAT Kelani Tyres (pvt) Ltd මගින් "CEAT Saksham" නැමති පෞරුෂත්ව සංවර්ධන එක් දින වැඩමුළුවක් 2017.07.26 දින පැවැත්විම.
6. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් පැවැත්වුණු Entrepreneurship Development නැමැති වැඩමුළුව 2017.08.24 දින පැවැත්විණි.
7. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සැඟවුණු කුසලතා හඳුනා ගැනීමේ UVPA Talent Show නම් වැඩසටහන ඔක්තෝබර් මස 03 දින සිට ක්‍රියාත්මක කිරිම.
8. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දින තුනක වැඩමුළුවක් Entrepreneurship Development නැමැති වැඩසටහන හා සම්බන්ධව 2017 නොවැම්බර් 06 දින සිට පැවැත්වීම.

**3. පශ්චාද් උපාධි අධ්‍යයන පාඨමාලා - මාධ්‍ය (සිංහල)**

| පාඨමාලාවේ නම | 2017 වර්ෂයේ ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 2017 අවසන් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | 2017 වර්ෂයේදී පශ්චාද් උපාධි නිබන්ධන භාරදී අගැයීමට යොමුකොට ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| දර්ශනපති (M.Phil) උපාධි පාඨමාලාව | 12 | 05 | 07 |
| දර්ශනසූරි (Ph.D) | 04 | 02 | 10 |
| ශාස්ත්‍රපති (MA) | - | 01 | 06 |
| ප්‍රාසංගික කලාපති (MPA) | - | 03 | 02 |

4. **බාහිර උපාධි පාඨමාලා**

| **ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | **ප්‍රාසංගික කලාවේදී (බාහිර) සාමාන්‍ය උපාධි පාඨමාලාව** | | |
|---|---|---|---|
| | පළමු වසර | දෙවන වසර | අවසන් වසර |
| 2013/2014 අධ්‍යයන වර්ෂය | - | - | 253 |

★ අභ්‍යන්තර සිසුන්ගේ විරෝධතා හේතුවෙන් 2017 වර්ෂයට අලුතෙන් ශිෂ්‍ය කණ්ඩායමක් බඳවාගැනීම සිදු නොකරන ලදී. විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ප්‍රතිව්‍යුහගත කිරීම් කටයුතු මෙම වසරේදී සිදු කරන ලදී.

05. **පර්යේෂණ දීමනා ගෙවීම් පිළිබඳ විස්තරය**

| **පීඨය** | **පර්යේෂණ දීමනාව ලබාගත් ආචාර්යවරු සංඛ්‍යාව** | **පර්යේෂණ දීමනාව ලබා නොගත් ආචාර්යවරු සංඛ්‍යාව** |
|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 17 | 13 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 35 | 03 |
| සංගීත පීඨය | 32 | 07 |
| පුස්තකාලය | 04 | 0 |
| බහු ශික්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය | 01 | 0 |
| පරිගණක ඒකකය | 03 | 0 |
| ඉංග්‍රීසි ඒකකය | 02 | 0 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 14 | 02 |
| එකතුව | 108 | 25 |

5.1 2017.11.15 දින සිට 2017.11.17 දින දක්වා පවත්වන ලද පර්යේෂණ පරිසංවාදයට ඉදිරිපත් කරන ලද පත්‍රිකා පිළිබඳ විස්තර.

| | පීඨය | පර්යේෂකයාගේ නම | පර්යේෂණ මාතෘකාව |
|---|---|---|---|
| 1 | නර්තන හා නාට්‍ය කලා පීඨය | Dr. Saumya Liyange<br>Senior Lecturer | Transgressing of the Self: How Actors Become Characters |
| 2 | | ආචාර්ය ඉන්දික ෆර්ඩිනැන්ඩු<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කොහොඹා යක්කංකාරියː ආර්ය-යක්ෂ දේශපාලන සංහිඳියාව අරභයා වූ සංස්කෘතික ව්‍යාපෘතිය |
| 3 | | කේ. එම්. සමන් කුමාරතුංග<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | සපරගමු ඩැක්කි වාදන සම්ප්‍රදාය පිළිබඳ විමසුමක් |
| 4 | | ජනක කෝට්ටේගොඩ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | සමාජ සන්නිවේදන අවකාශය තුළ රූප භාෂාවේ භූමිකාව |
| 5 | | අසේල රංගදේව<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | උඩරට නර්තන මූලිකාංග සඳහා නව ව්‍යායාම කායික විද්‍යානුකූල ප්‍රවේශයක් |
| 6 | | ආර්. බුද්ධික රණවීර<br>ආධුනික කථිකාචාර්ය | කෝලම් යනු ගර්භිණීන් උදෙසා සිදුකරන අභිචාර විධියක් ද? (මතවාද පිළිබඳ විමර්ශනයක්) |
| 7 | | එස්. ධනංජය තේනුවර<br>තාවකාලික කථිකාචාර්ය | ළමුන්ගේ සමාජ කුසලතා වර්ධනයෙහිලා ප්‍රාසංගික කලාවක් වශයෙන් තබ්ලා වාදන කලාවේ බලපෑම |
| 8 | | පියල් කාරියවසම්<br>බාහිර කථිකාචාර්ය | කතන්දර කීම දැනුවත් අරගලයකි |
| 10 | | සංජය කුමාර ජයලත්<br>තාවකාලික සහාය වාදක | සින්දු නාඩගම හා බැඳි ද්විත්ව මද්දල වාදන විධික්‍රම අධ්‍යයනය |
| 11 | | ජේ. ඒ. ශාන්ත පීරිස් ජයසිංහ<br>උපදේශක | නාඩගම් සංගීතය සඳහා කර්ණාටක සහ කතෝලික ගායනා පමණක් නොව, උත්තරභාරතීය රාගධාරී සංගීතය ද මිශ්‍ර වී ඇත |
| | | | හෙළ ජන ගී නාදරටා තුළ පවත්නා රංගපරම තනු පිළිබඳ අධ්‍යයනයක් |
| 12 | | එස්. කේ. ජී. උත්පලා සූරියආරච්චි<br>උපදේශක | රටයකුමේ උපත් කථාව විකාශනයේ දී පිළිබිඹු වන පෙරදිග දෘශ්‍ය කාව්‍ය නිර්මාණ ලක්ෂණ |

| | | | |
|---|---|---|---|
| 13 | | ඩබ්ලිව්. රුවන් පුෂ්පකුමාර<br><br>තාවකාලික සහය වාදක | බෙර වාදකයෙකුගේ ශාරීරික හා විඥාන රූපයේ ක්‍රියාකාරීත්වය සිදුවන්නේ කෙසේද? |
| **නර්තන හා නාට්‍ය කලා පීඨයෙන් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 13** | | | |
| 14 | සංගීත පීඨය | ඩී. කේ. ලලිත් කුමාර<br><br>බාහිර උපදේශක | එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණය තුල මද්දල භාවිතය චරිතයන්ගේ භාවෝත්පාදනය පිණිස උපයෝගී කරගත් ආකාරය |
| **සංගීත පීඨයෙන් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 1** | | | |
| 15 | දෘශ්‍ය කලා පීඨය | ආචාර්ය ඩබ්. රංජිත් ධර්මතිලක<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ෂඩ් වර්ණ සංකල්පයේ විකාශය පිළිබඳ දෘශ්‍ය සන්නිවේදනාත්මක අධ්‍යයනයක් |
| 16 | | ඩබ්. ඒ. පී. සී. එස්. වික්‍රම ආරච්චි<br><br>ආධුනික කථිකාචාර්ය | ප්‍රචාරණ සන්නිවේදනයේදී නිදර්ශන චිත්‍රය සමඟ ඡායාරූපය බද්ධවීම (ශ්‍රී ලංකාව සහ ලෝකය තුළ සංසන්දනාත්මක අධ්‍යයනයක්) |
| 17 | | යූ. ජී. එන්. ඩී. වීරසිංහ<br><br>තාවකාලික කථිකාචාර්ය | ශ්‍රී ලංකාවේ රෙදිපිළි වර්ණ ගැන්වීමේ සාම්ප්‍රදායික ක්‍රමවේද සහ නව ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් (ප්‍රායෝගික පර්යේෂණ ඇසුරෙන්) |
| 18 | | අයි. ඒ. එන්. ඉලංගරත්න<br><br>තාවකාලික කථිකාචාර්ය | යටත් විජිත සමය තුළ ශ්‍රී ලංකාවේ ගමන් මලු සැලසුම්කරණය සහ එහි භාවිතය පිළිබඳ අධ්‍යයනයක් |
| 19 | | එස්. එම්. දිල්රුක්ෂි<br><br>තාවකාලික කථිකාචාර්ය | නුවර යුගයේ සිතුවම් තුළ සජීවීකරණයේ මූලික විධික්‍රම අන්තර්ගතවේද යන්න පිළිබඳ අධ්‍යයනයක් (නුවර යුගයේ පහතරට විහාර සිතුවම් ඇසුරින්) |
| 20 | | Gaya Nagahawatta<br>Visiting Lecturer | Contemporary 'Classical' Sinhala Cinema in Sri Lanka: Some Thoughts on Gender |
| 21 | | U.P.S. Chathumali<br><br>Temporary Lecturer | Modernizing Hereditary Pottery Practices in Sri Lanka through Institutionalization; the Role of Government Pottery Centers |
| **දෘශ්‍ය කලා පීඨයෙන් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 7** | | | |
| 22 | තොරතුරු තාක්ෂණ ඒකකය | I.A.K.C. Samarasinghe<br>Senior Lecturer | An Investigation of the Correlation between Students Entrance Scores and Grade Point Average |
| 23 | | R .D. Sampath Nishan Kularathna<br>Computer Instructor | Automated Approach for Manual Help Lines |

| | | | |
|---|---|---|---|
| **තොරතුරු තාක්ෂණ ඒකකයෙන් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 2** | | | |
| 24 | පරිපාලන කාර්යමණ්ඩලය | B.M. Dayawansa | A Correlation Analysis of the Aptitude Test, Z-Score Marks & Final Results of Students Enrolled at the University: A Case of Visual and Performing Arts Degree Students |
| 25 | | R.T.M. Ranathunge<br>Deputy Registrar | Factors Affecting Organizational Conflict: A Literature Analysis |
| 26 | | D.N. Gurusinghe<br>Deputy Registrar | The Impact of Motivators and Hygiene Factors on the Employee's Satisfaction: A Case Study of Non-Academic Staff of the University of the Visual and Performing Arts |
| 27 | | C.V. Imbulgoda<br>Deputy Registrar | Rule-based Administration to Result-based Management: A Study Relating to the University of the Visual and Performing Arts |
| 28 | | A.A.C.J. Adikari<br>Assistant Registrar | The Scope of Exceptions in Implementing RTI Act within the University of the Visual and Performing Arts: Integrity of Examinations and Personal Information |
| **පරිපාලන කාර්යමණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 5** | | | |
| 29 | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපාධිධාරි | ඩී. ඩී සිතාරා මධුවන්ති<br>ප්‍රාසාංගික කලාවේදී විශේෂ උපාධිධාරි | දේශීය හේරි වාදනයේ උපරිම ශිල්පීය ශක්‍යතාවයන් ලබා ගැනීමට ස්ත්‍රීත්වය බාධා වේදැ |
| 30 | | Namal Avanthi Jayasinghe<br>PhD Candidate<br>UVPA | A Critical Analysis of the Relationship between Culture and Personality within Sri Lankan Context |
| 31 | | Michelle Jayasinghe<br>MPhil Candidate<br><br>UVPA | The Significance of Mediatization in Today's Theatre: A Study of Contemporary Sri Lankan Plays; Dharmasiri Bandaranaike's Eka Adhipathi and Jerome L De Silva's Adaptation of Andrew Lloyd Weber's Phantom of the Opera |
| 32 | | රංග මනුප්‍රිය කුරුවිට ආරච්චි<br>ප්‍රාසාංගික කලාවේදී විශේෂ උපාධිධාරි | MITSEIN වේදිකාව, ප්‍රපංචවේදය හා ජනවාර්ගික ගැටලුව |
| **සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපාධිධාරින් විසින් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 4** | | | |

| | | | |
|---|---|---|---|
| 33 | විදේශීය පර්යේෂක | Nikhil V Bhagat, Assistant Professor in TablaDepartment of Music and Dramatics<br><br>Shivaji University,India | Extendable Compositions in Tabla Solo Recital - The First Half |
| **විදේශීය පර්යේෂකයින් විසින් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 1** | | | |
| 34 | වෙනත් විශ්වවිද්‍යාල හා ආයතන | රිචඩ් බණ්ඩාර නිකපිටිය | ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික ගැටබෙරයේ සහ එහි නිෂ්පාදන ක්‍රියාවලියේ නව ප්‍රවණතා |
| 35 | | ඒ. එස්. ඉරංග<br><br>ශාස්ත්‍රවේදී (විශේෂ) ජනමාධ්‍ය<br><br>ශ්‍රිපාලි මණ්ඩපය | දේශපාලන ආගමික විඥානය හැඩගැස්වීමෙහිලා ශිලාලිපි සංඥාර්ථයන්හි භූමිකාව පිළිබඳ විමර්ශනයක් (රජරට රාජධානි අවධියට විශේෂිතව) |
| 36 | | Amarasuriya, S.D.Gunathilaka, K.D.K., Rajasuriya, C.M.,Weerasinghe, A.N.T., Jayasinghe, Saroj Lecturers<br><br>Faculty of Medicine<br><br>University of Colombo | Exploring the Convergence of the Arts and Humanities with Medical Education in Sri Lanka |
| 37 | | Gunasekara, H Lecturer (Probationary) - OUSL Wickramasinghe A.T.P<br><br>Senior Lecturer - University of Moratuwa | An Analysis of Female Body Shapes of Sri Lankan Women Age Between 25 - 35 Years |
| 38 | | එන්. එම්. සාලින්ද රොෂාන් බණ්ඩාර<br>දෘශ්‍ය සැලසුම්කරණ හා ප්‍රාසාංගික කලා උපාධිධාරි<br>ලලිත කලා අධ්‍යයනාංශය<br>කැළණිය විශ්වවිද්‍යාලය | දෘශ්‍ය කලා ශිල්පීන් හා බැඳුණු බුද්ධිමය අයිතීන්: ශ්‍රී ලංකාවේ 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත යටතේ ප්‍රකාශන අයිතිය පදනම් කර ගත් දෘශ්‍ය කලා විග්‍රහය |
| 39 | | B.M.S. Cooray<br>Assistant Lecturer for German Studies<br>Department of Modern Languages<br><br>University of Kelaniya | The Historical Snow White: The Origin of the Snow White Fairy Tale of Children's and Household Stories of Brother Grimm |

| | | | |
|---|---|---|---|
| 40 | | Merinnage Nelani De Costa<br>Assistant Lecturer (Temp)<br><br>Department of English & Linguistics<br><br>Faculty of Humanities and Social Sciences University of Sri Jayewardenepura | The Absurd Heroes of Resistance in Translated Works of Literature:<br><br>A Comparative Analysis of Selected Short Stories by Franz Kafka and Albert Camus |
| 41 | | A.P.Kumarasingha<br><br>Research Assistant<br><br>Palm Leaf Manuscripts Study and Research Library<br><br>University of Kelaniya | පුස් කොළ පොත් එකතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යනයක්: කළුගමුව වර්ධනාරාමය විහාරස්ථානය ඇසුරින් |
| 42 | | ටී. ඒ. එම්. යූ. වාසල<br><br>අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය<br><br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | මැදපෙරදිග රැකියා සඳහා මවුවරුන් විදේශගතවීම තුලින් ඔවුන්ගේ දරුවන් කෙරෙහි ඇතිකරන බලපෑම (මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්) |
| 43 | | ඩී. පී. ආර්. එල්. ගුණරත්න<br><br>සහකාර පුස්තකාලයාධිලපති (වැ. බ)<br><br>ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය | විශේෂ පුස්තකාලවල එකතු සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනයක්: ඇඟලුම් කර්මාන්ත පුස්තකාල ඇසුරෙනි |
| 44 | | D C Perera<br><br>Senior Assistant Registrar<br><br>Institute of Human Resource Advancement<br><br>University of Colombo | The Impact of Information Systems on the Successful Management of Higher Educational Institutions |
| **වෙනත් විශ්වවිද්‍යාලය හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද මුළු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව = 11** | | | |

6. කාර්ය මණ්ඩල විස්තර

6.1 අනුමත කාර්ය මණ්ඩලය 2017

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යයන | 114 |
| අධ්‍යයන සහායක | 56 |
| පරිපාලන | 24 |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | 144 |
| කණිෂ්ඨ | 115 |

**6.2.** **අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය අදාළ අංශ/පීඨවලට අනුයුක්ත කර ඇති ආකාරය**

| **පීඨය** | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය/සහකාර කථිකාචාර්ය (තාවකාලික) | කථිකාචාර්ය (අලුතින) | උපදේශක | සහායවාදක | ප්‍රදර්ශක | බාහිර කථිකාචාර්ය | විද්‍යාත්මක සහකාර (II ශ්‍රේණිය) | සහකාර පරිගණක ජාල කළමනාකරු II | ශාරීරික අධ්‍යාපන උපදේශක(I ශ්‍රේණිය) | ක්‍රමසම්පාදක සහ පද්ධති විශ්ලේෂක (I ශ්‍රේණිය) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | - | 01 | 02 | 14 | 00 | 25 | 12 | 01 | - | - | 119 | - | - | - | - |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 02 | 03 | 01 | 27 | 02 | 06 | 01 | 20 | 02 | 11 | 63 | - | - | - | - |
| සංගීත පීඨය | - | 01 | 01 | 24 | 02 | 05 | 11 | 07 | 09 | - | 44 | 01 | - | - | - |
| පරිගණක මධ්‍යස්ථානය | - | - | - | 03 | - | - | - | - | - | - | - | - | 02 | - | - |
| ඉංග්‍රීසි ඒකකය | - | - | - | 02 | - | - | - | - | - | - | - | - | - | - | - |
| බහු ශික්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය | - | - | - | - | - | - | 01 | - | - | - | - | - | - | - | - |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | - |
| විභාග අංශය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 |

| | **පුස්තකාලයාධිකාරී** | **ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී** | **සහකාර පුස්තකාලයාධිකාරී** |
|---|---|---|---|
| පුස්තකාලය | 01 | 02 | 01 |

6.3 **පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අදාළ අංශ/පීඨවලට අනුයුක්ත කර ඇති ආකාරය.**

| *පීඨය/ශාඛාව* | *පරිපාලන* | *අනධ්‍යයන* | *කණිෂ්ඨ* |
|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 02 | 11 | 10 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 01 | 14 | 05 |
| සංගීත පීඨය | 01 | 14 | 03 |
| උපකුලපති කාර්යාලය | 01 | 03 | 02 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 01 | 01 | 02 |
| අධ්‍යයන ආයතන | 01 | 04 | 02 |
| අනධ්‍යයන ආයතන | 01 | 03 | 01 |
| විභාග අංශය | 01 | 06 | 01 |
| අධ්‍යයන සහ ශිෂ්‍ය සේවා | 01 | 07 | 01 |
| සාමාන්‍ය පාලන | 01 | 11 | 19 |
| මුදල් | 04 | 15 | 03 |
| පර්යේෂණ හා ප්‍රකාශන | 01 | 02 | 01 |
| අභ්‍යන්තර විගණන | 02 | 01 | - |
| නීති හා ප්‍රලේඛන | 01 | 01 | 01 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | - | 01 | 01 |
| විවෘත හා දුරස්ථ අධ්‍යයන | 02 | 03 | 01 |
| පශ්චාද් උපාධි අධ්‍යයන | - | 02 | 01 |
| පර්යේෂණ හා මාධ්‍ය | - | - | - |
| කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය | - | - | - |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | - | - |
| සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය | * 01 | 02 | 03 |
| නඩත්තු අංශය | 01 | 03 | 17 |
| සංයුක්ත කළමනාකරණ අංශය | 01 | 01 | - |
| පුස්තකාලය | - | 08 | 03 |

* වැටුප් රහිත නිවාඩු ලබා ඇත

6.4. **සමස්ත කාර්ය මණ්ඩල වෙනස්වීම්**

| | අධ්‍යය න | අධ්‍යයන සහායක | පරිපාලන සහ මූල්‍ය | අනධ්‍යයන |
|---|---|---|---|---|
| නව පත්වීම් | 02 | 01 | - | 12 |
| සේවයේ තහවුරු කිරීම් | 07 | 01 | 02★ | 23 |
| උසස්වීම් | 20★ | 13 | - | 15 |
| ස්ථාන මාරුවීම් (වෙනත් වි.විද්‍යාල සිට මෙම වි.විද්‍යාලයට) | - | - | 01 | 02 |
| සේවා දීර්ඝ කිරීම් (අවු.57 න් ඔබ්බට) | - | - | - | - |
| විශ්‍රාම යෑම් | 02 | 01 | - | - |
| ඉල්ලා අස්වීම් | - | - | - | 01 |
| තනතුර අතහැර යෑම් | - | - | - | - |
| සේවය අත්හිටුවීම් | - | - | - | - |
| සප්ත වාර්ෂික නිවාඩු | 06 | - | 02 | - |
| අධ්‍යයන නිවාඩු | 04 | 01 | - | - |
| එතෙර නිවාඩු | 65 | 36 | 13 | 01 |
| අධ්‍යයන නිවාඩු දීර්ඝ කිරීම් | 03 | - | - | - |
| සප්ත වාර්ෂික නිවාඩු අවසන් වී සේවයට වාර්තා කිරීම් | 03 | - | - | - |
| අධ්‍යයන නිවාඩු අවසන් වී සේවයට වාර්තා කිරීම් | 03 | - | - | - |
| මරණ | - | - | - | 01 |

★ **සේවයෙහි තහවුරු කිරීම, උසස්වීම් පෙරදාතම් කර ලබාදී ඇත.**

07.කාර්ය මණ්ඩල සංවර්ධනය

07.01 පරිපාලන කාර්යය මණ්ඩල සහභාගි වු සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර

| අනු අංකය | වැඩමුළුව/සම්මන්ත්‍රණය | මෙහෙයවනු ලබන ආයතනය | සහභාගී වු නිලධාරීන් | පැවැත්වු කාලසීමාව |
|---|---|---|---|---|
| 01. | **International Programme on Management** | **Kasetsart University and Postgraduate Institute of Management** | 1. ආර්.ටී.එස්. රණසිංහ මිය | 2017.08.20<br>2017.08.28 |
| 02. | **2017 Seminar on Higher Education Management for Developing Countries** | **Government of China & Department of External Resources** | 1.සී.වී. ඉඹුල්ගොඩ මිය<br>2.ජී.ඩබ්.ඒ.බී. විජේසිංහ මයා | 2017.09.04<br>2017.09.28 |
| 03. | **International Management Programme on Activating Career Transformation for Aspiring Women Leaders.** | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 1.ආර්.ටී.එම්. රණතුංග මිය<br>2.පී.ජී.එස්.පී. නානායක්කාර මිය | 2017.10.09<br>2017.10.17 |
| 04. | **International Programme on Management** | **University of Hong kong and Postgraduate Institute of Management.** | 1.ජේ.පී. බාලසූරිය මිය<br>2.එස්.වී.එන්. පෙරේරා මිය | 2017.10.31<br>2017.11.08 |
| 05. | විනය කාර්ය පරිපාටි | **Skills Development Fund Limited** | 1.ආර්.ටී.එම්. රණතුංග මිය<br>2.ඩබ්.එම්.ඩබ්ලිව්. වන්නිනායක මයා<br>3.ඩී.එන්. ගුරුසිංහ මිය<br>4.පී.ජී..එස්.පී. නානායක්කාර මිය<br>5.ඩබ්.ඒ.එන්.සී. විජේසිංහ මිය<br>6.ඩී.එම්.කේ.ජී. නිරෝෂිණී මිය<br>7.ජේ.පී. බාලසූරිය මිය<br>8.එස්.වී.එන්. පෙරේරා මිය<br>9.ආර්.ටී.එස්. රණසිංහ මිය<br>10.කේ.එච්.ඩී.එච්.පී. කුමාරසිංහ මිය<br>11.ඒ.ඒ.සී.ජේ. අධිකාර මිය<br>12.එස්.එෆ්. ඉමාම් මිය | 2017.12.04<br>2017.12.05 |

| අනු අංකය | වැඩමුළුව/සම්මන්ත්‍රණය | මෙහෙයවනු ලබන ආයතනය | සහභාගී වු නිලධාරීන් | පැවැත්වු කාලසීමාව |
|---|---|---|---|---|
| 06. | Workshop on Conflict Management and Grievance Handling | Miloda Academi of Financial Studies – Colombo 01 | 15 | 2017.04.26 දින |
| 07. | Workshop on Graduate Profiles | Prof. .Ajith Jayaweea, Director/ SDC, Wayamba University | 13 | 2017.11.13 |
| 08. | Team Building Programme | Mr. A.G Karunarathna, Former Registrar, Rajarata University | 12 | 2017.12.29 සිට 2017.12.30 |

07.02 අනධ්‍යයන කාර්යය මණ්ඩල සහභාගි වු සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර

| අනු අංකය | වැඩමුළුව/ සම්මන්ත්‍රණය | මෙහෙයවනු ලබන ආයතනය | සහභාගී වු නිලධාරීන් | පැවැත්වු කාලසීමාව |
|---|---|---|---|---|
| 01. | ස්ථාවර වත්කම් විගණනය | Prag Service (pvt) Ltd | 1.බී.ජී.ආර්.ටී. කුලතුංග මයා<br>2.එස්.එම්.එන්. ධනංජය මයා<br>3.කේ.එම්.ඒ.කේ.කුලතුංග මෙය<br>පරිගණක යෙදුම් සහකාර | 2017.01.19 |
| 02. | Workshop for Library Supportive Staff in University System | විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය – රුහුණ විශ්වවිද්‍යාලය | 1.අයි.ඩී. රම්මුතු මෙය<br>(පුස්තකාල තොරතුරු සහකාර **III** ශ්‍රේණිය)<br>2.එච්.ඒ.ඒ.කුමාර මයා<br>(පුස්තකාල සහායක **II** ශ්‍රේණිය) | 2017.03.23 – 2017.03.24 |
| 03. | ආරක්ෂිත කැමරා සම්බන්ධ පුහුණු පාඨමාලාව | **VMS Technical Centre** | 1.ඒ.ජී.ඩී.සී.පෙරේරා මයා<br>2.එන්.ජී.එස්. රත්නසිරි මයා<br>3.ඒ.ඒ.එස්. නානායක්කාර මයා<br>විදුලි කාර්මික **II** ශ්‍රේණිය | 2017.06.04 -2017.06.05 |
| 04. | වාහන කළමනාකරණය | **Prag Service (pvt)Ltd** | 1.බී.ඒ.එන්. බමුණුආරච්චි මයා<br>(ලිපිකරු **III** ශ්‍රේණිය) | 2017.06.28 |
| 05. | General Conducts, Office Procedures and Leave | Mr. A.G Karunarathna, Former Registrar, Rajarata University | වැඩ සහායක 51<br>ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි 53 | 2017.05.05 |
| 06. | Workshop on Fundamental in Computer System | Dr. Anusha Jayasiri, Head/ IT Center<br>Mr. A. Wickramasinghe, Snr Lecture/ IT Center<br>Ms. K. Samarasinghe, Snr. Lecture/ IT Center | 28 | 2017.11.21 |
| 08. | Team Building Programme | Mr. A.G Karunarathna, Former Registrar, | 70 | 2017.12.29 2017.12.30 |

08. **යටිතල පහසුකම් පිළිබඳ විස්තර**

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | මුළු පිරිවැය ඇස්තමේන්තුව (TCE) (රුපියල් මිලියන) | 2017 වර්ෂය වන විට වියදම (රුපියල් මිලියන) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| ඇල්බට් චන්ද්‍රවංකය සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I සහ II) නර්තන හා නාට්‍ය කලා පීඨ ගොඩනැගිල්ල | 870 මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයක ව්‍යාපෘතියකි. | - | ඉදිකිරීම් කටයුතු අවසාන වී ඇත. |
| ඇල්බට් චන්ද්‍රවංකය සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I සහ II) නර්තන හා නාට්‍ය කලා පීඨ ගොඩනැගිල්ල | | - | ඉදිකිරීම් කටයුතු අවසාන වී ඇත. |
| ඇල්බට් චන්ද්‍රවංකය සංවර්ධන ව්‍යාපෘතිය (අදියර III පියවර I) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | | - | ඉදිකිරීම් කටයුතු අවසාන වී ඇත. |
| ඇල්බට් චන්ද්‍රවංකය සංවර්ධන ව්‍යාපෘතිය (අදියර III පියවර II) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | | - | ඉදිකිරීම් කටයුතු අවසාන වී ඇත. |
| ඇල්බට් චන්ද්‍රවංකය සංවර්ධන ව්‍යාපෘතිය (අදියරIV- පියවර II) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම | | - | ඉදිකිරීම් කටයුතු අවසාන වී ඇත. |
| ඇල්බට් චන්ද්‍රවංකය සංවර්ධන ව්‍යාපෘතිය (අදියර IV- පියවර II) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම | | - | ඉදිකිරීම් කටයුතු අවසාන වී ඇත. |

**09.පුස්තකාල ග්‍රන්ථ එකතුවේ සංසන්දනාත්මක විස්තර 2016/2017**

| | 2016 | 2017 |
|---|---|---|
| මුළුපොත් ගණන | 54482 | 56146 |
| සඟරා ගණන | 41 | 49 |
| නව ප්‍රතිග්‍රහණ | 969 | 1665 |

10. **මහපොළ හා ශිෂ්‍යාධාර ලබන්නන්ගේ විස්තර (2017)**

| **පීඨය** | **මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව** | **ගෙවීම් විස්තරය රු.** | **ශිෂ්‍යාධාරලාභීන් සංඛ්‍යාව** | **ගෙවීම් විස්තරය රු.** |
|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 196 | 9,851,250.00 | 91 | 1,944,600.00 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 556 | 24,456,550.00 | 152 | 13,131,200.00 |
| සංගීත පීඨය | 406 | 18,271,050.00 | 111 | 5,835,700.00 |
| **එකතුව** | **1158** | **52,578,850.00** | **354** | **20,911,500.00** |

# <u>විගණන කමිටු වාර්තාව - 2017</u>

## <u>විගණන කමිටු සංයුතිය හා රැස්වීම්</u>

විගණන කමිටු සාමාජිකත්වය, පාලක සභාව විසින් පත් කරනු ලැබූ පාලක සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් හා ලේඛකාධිකාරීගෙන් සමන්විත වේ.

සී. මාලියද්ද මහතා (සභාපති - පාලක සභා සාමාජික) , ආචාර්ය ධර්මසේන පතිරාජ මහතා (පාලක සභා සාමාජික) , සී. එස්. කරුණාරත්න මිය (පාලක සභා සාමාජික) , මහාචාර්ය කුසුමා කරුණාරත්න මිය (සී. එස්. කරුණාරත්න මිය වෙනුවට පත් කරන ලද පාලක සභා සාමාජික), ආර්. ටී. එම්. රණතුංග මිය (ලේඛකාධිකාරී - වැඩ බලන) යන මහත්ම මහත්මීන් සමාලෝචිත වර්ෂය තුලදී විගණන කමිටු සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ලදී.

වර්ෂය තුලදී විගණන කමිටු රැස්වීම් 4 ක් පවත්වන ලද අතර පීඨාධිපතිවරුන් හා විධායක නිළධාරීන් ආරාධනය මතද, විගණන අධිකාරී නිරීක්ෂක වශයෙන්ද, එම රැස්වීම් සඳහා සහභාගී වූහ.

## <u>ඉටුකරන ලද කාර්යයන්</u>

තත් කාර්යය අත්තිකාරම් පියවීමේදී සිදු වී තිබූ අක්‍රමිකතා සම්බන්ධ අභ්‍යන්තර විගණන වාර්තා තව දුරටත් විමර්ශනය කර එම තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීමට හා සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම පිණිස පාලක සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

2015 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (2) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සඳහන් එක් එක් නිරීක්ෂණය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බවට අදාළ අංශ ප්‍රධානීන් විසින් මීට පෙර දන්වා තිබූ අයුරින් කටයුතු කිරීම පිළිබඳ ප්‍රගතිය විමර්ශනය කරන ලද අතර, අවශ්‍ය නිර්දේශ සහිතව පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

සංයුක්ත සැලසුම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කෙටුම්පත් වාර්ෂික වාර්තාව, වාර්ෂික වාර්තාව, මූල්‍ය ප්‍රකාශන, ප්‍රසම්පාදන සැලැස්ම හා භාණ්ඩ සමීක්ෂණ යනාදී වාර්තා සැකසීම හා ඒවා අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම පිළිබඳව විමර්ශනය කර අවශ්‍ය නිර්දේශ පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

2016 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (2) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සඳහන් එක් එක් නිරීක්ෂණය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් විසින් ඒ සඳහා ගෙන ඇති/ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග හා ඒවා නිවැරදි කිරීම සඳහා ගනු ලබන කාලය පිළිබඳ වාර්තාව විමර්ශනය කර අවශ්‍ය නිර්දේශ සහිතව පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ඉහත කී වාර්තාවේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අර්ධවාර්ෂිකව පරීක්ෂා කර විගණන කමිටුව වෙත වාර්තා කළ යුතු බවට අභ්‍යන්තර විගණන අංශය වෙත උපදෙස් දෙන ලදී.